# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,059 - 2018 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා- 2018.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික/තාක්ෂණික නොවන නිලධර ගණයේ III ශ්‍රේණියේ වනසත්ත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017(2018)**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, III ශ්‍රේණියේ වනසත්ත්ව අඩවි ආරක්ෂක තනතුරු පුරප්පාඩු 57 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් පමණි.) මෙම විභාගය 2018 ජුනි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. *වැටුප් ක්‍රමය :*

මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා රු. 12,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව වනසත්ත්ව අඩවි ආරක්ෂක III තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 31,040- 10 x 445 - 11 x 660- 10 - 730 - 10 x 750 - රු. 57,550 (MN3-2016) වේ.

ඔබට වැටුප් ගෙවුන ලබන්නේ එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදා : 2018.01.01 දින සිට 2018.12.31 දක්වා රු. 24,626.00 ක මූලික වැටුපක් හා රු. 3,380.00 ක ගැලපුම් දීමනාවක් හිමි වේ.)

02. *සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :-*

i. වනසත්ත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා තෝරාගනු ලබන සියලුම දෙනා පුහුණු වනසත්ත්ව අඩවි ආරක්ෂක ලෙස මාස 06ක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර එම කාලය සඳහා දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණු පාඨමාලාව අවසන් කරන නිලධාරීන් වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

ii. පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත්වන හෝ පුහුණු කාලය තුළදී සේවය අතහැර යන තැනැත්තකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා හිමිකමක් නොමැත.

iii. වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්විය යුතු වේ. තව ද, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iv. පත්වීම අවු. 03 ක පරිවාස කාලයකට යටත් වේ.

v. වනසත්ත්ව අඩවි ආරක්ෂකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

vi. ගැසට් පත්‍රයේ 2 ඡේදයෙහි පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.

vii. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. *වයස් සීමාව :*

ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 දිනට වයස අවු 18 ට නොඅඩු සහ අවු 30 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාල නොවේ.) (ඒ අනුව 2000.03.15 දිනට හෝ ඊට පෙර හා 1988.03.15 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06)ක් සමත් වී තිබිය යුතු ය.

සහ

ii. පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 04 කින් සමත්ව තිබීම ;

හෝ

නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 03කින් (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්ව තිබීම.

iii. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

iv. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

v. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

vi. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

vii. පිරිමි අයදුම්කරුවන් පමණක් විය යුතු අතර, උස අඩි 05 යි, අඟල් 04 කට නොඅඩු විය යුතු ය. පපුව අඟල් 32 ක් විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර , ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී හා ලිඛිත පරීක්ෂණයේදී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

ii. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේදී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙක් සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. භාෂා දැනුම | 10 |
| 3. පළපුරුද්ද | 20 |
| 4. වෘත්තීය සුදුසුකම් | 30 |
| 5. කුසලතා හා විශිෂ්ට දක්ෂතා | 15 |
| 6. පෞරුෂත්වය | 05 |
| එකතුව | 100 |

iv. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාවය අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිකව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම සිදුවේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවිය හරහා සිදුකරනු ඇත.

v. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමෙන් පසු වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03 ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

06. *විෂය නිර්දේශය :*
ලිඛිත විභාගය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්‍ෂණය හා අවබෝධය | පැය 1 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්‍ෂණය | පැය 2 | 100 | 40% |

බුද්ධි පරීක්ෂණය හා අවබෝධය :

පද, සංඛ්‍යා, රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු විශේෂයකි. අපේක්ෂකයින් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළුව පිළිබඳ අවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය සහ අවකාශය අතර, සම්බන්ධතාවය වටහා ගැනීමෙහිලා අපේක්ෂකයින්ගේ හැකියාව මනින කෙටි ප්‍රශ්නවලින් යුත් ප්‍රශ්න පත්‍රයකි.

සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය :

වනජීවී සංරක්ෂණය පිළිබඳ ජාතික කලාපීය හා සමස්ථ ලෝකයේ සංවිධාන, පරිසරය පිළිබඳ දැනුම හා සමාජීය, සංස්කෘතික හා විද්‍යාත්මක, දේශපාලනික, ආර්ථික කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුවත්භාවය මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

07. අයදුම්පත් හා අනෙකුත් විස්තර :

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව, අයදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය ඊළඟ පිටුවලටද, ඇතුළත් වන පරිදි සෙ. මී. 21x29 (A4 ප්‍රමාණයේ) කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම් පත්‍රය විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තරය අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා තිබේද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වන සත්ත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2017'' යනුවෙන් සඳහන් කර 2018.03.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

ii. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජනවාරි මස 05 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 දෙසැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

iii. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

iv. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතුය.

v. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූලනොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම ඉල්ලුම්පත් ස්වකීය ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

vii. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

08. විභාග ගාස්තු :

i. විභාග ගාස්තුව රු. 600.00 කි එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13 යටතේ රාජ්‍ය ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අයකිරීමක් නොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන 2018.03.15 වැනි දිනට පෙර ගෙවිය යුතුය.

(එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ලඟ තබා ගැනීම සුදුසුය.)

ii. කුමන කරුණක් යටතේ වුවද, විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තු සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

09. පහත සඳහන් ලිපිලේඛන වලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය. :

i. උප්පැන්න සහතිකය;
ii. අධ්‍යාපන සහතික;
iii. මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක්;
(ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව)
iv. චරිත සහතික දෙකක්;
v. වෙනත් අදාල සහතික.

සැලකිය යුතුය.-ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම්පත්‍රය සමඟ එවීම නොකළ යුතුයි.

10.

i. විභාගය මෙහි උපලේඛනය - 1 හි දැක්වෙන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථාන වල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර සහා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවැනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැතිනම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

ii. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුල වන අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමාසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

iv. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමාසරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. අපේක්ෂකයාගේ අනන්‍යතාවය.- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකිය.

13. අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවි අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයන් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජී. සී. සූරියබණ්ඩාර,
වනජීවී අධ්‍යක්ෂ ජනරාල්.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

## වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන නිලධර ගණයේ III ශ්‍රේණියේ වන සත්ත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017 (2018)

## Open Competitive Examination for Recruitment to the Post of Management Assistant Supervisory Non-Tech/Tech Grade III wildlife Ranger of the Wildlife Department - 2017(2018)

විභාගයට පෙනී සිටින නගරය :

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න.)

01 විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

02. (i) මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා. GUNAWARDHANA M. G. B. S. K.)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. ස්ත්‍රී/පුරුෂභාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06.
(i) උපන් දිනය :

අවුරුද්ද මාසය දිනය

(ii) 2018.03.15 දිනට වයස :

අවුරුදු මාස දින

07. පුරවැසිභාවය :

පරම්පරාවෙන් - 1
ලියාපදිංචිවීමෙන් - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

08. ජංගම දුරකථන අංකය

09. අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :————.
විභාග අංකය :————.

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————.

විභාග අංකය :————.

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

10. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

11. වෘත්තීය සුදුසුකම් :————.

12. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :

(i) ලදුපත් අංකය හා දිනය :————.

(ii) ගෙවූ මුදල :————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.

13. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

(i) ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

(i) ආයතනය :————.
(ii) මුල් පත්වීමේ දිනය :————.
(iii) තනතුර :————.
(iv) වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :

(i) :————.
(ii) :————.

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන,
(අත්සන සහතික කරන්නා ඉදිරියේදී
අත්සන යෙදිය යුතුය)

දිනය :————.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................... මහතා/මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2018 ............ වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාව තබන්න)

18. අයදුම්කරු රජයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ස්ථිර/ තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා

තෝරා ගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

__________,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින්
බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම :__________.
තනතුර :__________.
(මුද්‍රාව තබන්න)
දිනය :__________.
(අනවශ්‍ය වචන කපා හරින්න)

*සැ. යු.*-ඉල්ලුම් පත්‍රය සමඟ මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

උපලේඛනය - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

02-525/1

---

**තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික/තාක්ෂණික නොවන - බණ්ඩ 2 නිලධර ගණයට අයත් වන සත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2017(2018)**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, III ශ්‍රේණියේ වන සත්ත්ව නියාමක තනතුරු පුරප්පාඩු 220ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත කැඳවනු ලැබේ. බඳවාගනු ලබන සංඛ්‍යාවෙන් 3% ක් කාන්තා අයදුම්කාරියන් සඳහා වෙන් කරනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කාරියන් සංඛ්‍යාවක් සුදුසුකම් නොලදහොත් ඉතිරි සංඛ්‍යාවද පිරිමි අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ. මෙම විභාගය 2018 ජුනි මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. *වැටුප් ක්‍රමය :*
මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ත්ව නියාමක තනතුර සඳහා රු. 10,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව වන සත්ත්ව නියාමක III තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 27,140- 10 x 300 - 11 x 350- 10 x 495 - 10 x 660 - 45,540 (MN1-2016) වේ.

ඔබට වැටුප් ගෙවුනු ලබන්නේ එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදා : 2018.01.01 දින සිට 2018.12.31 දක්වා රු. 21,532.00 ක මූලික වැටුපක් හා රු. 4,306.00 ක ගැලපුම් දීමනාවක් හිමි වේ.)

02. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :-

i. වනසත්ත්ව නියාමක තනතුර සඳහා තෝරාගනු ලබන සියළුම දෙනා පුහුණු වන සත්ත්ව නියාමක ලෙස මාස 06ක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර එම කාලය සඳහා දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුව සාර්ථකව අවසන් කරන නිලධාරීන් වනසත්ත්ව නියාමක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

ii. පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත් වන හෝ පුහුණු කාලය තුලදී සේවය අතහැර යන තැනැත්තෙකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා හිමිකමක් නොමැත.

iii. වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්විය යුතු වේ. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iv. පත්වීම අවු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

v. වන සත්ත්ව නියාමකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදනම්ව සිටිය යුතු ය.

vi. *ගැසට් පත්‍රයේ* 2 ඡේදයෙහි පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරිමේදී අදාල වන පොදු කොන්දේසි අදාල වේ.

vii. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. *වයස් සීමාව :*
ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 දිනට වයස අවු. 18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.03.15 දිනට හෝ ඊට පෙර හා 1988.03.15 දින හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය මේ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදල නොවේ.)

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබිය යුතු ය.

iii. වෘත්තීය සුදුසුකම් :
ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

iv. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

v. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

vi. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

vii. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

viii. පිරිමි අයදුම්කරුවන් සඳහා උස අඩි 05 යි, අඟල් 04 කට නොඅඩු විය යුතු ය.
කාන්තා අයදුම්කරුවන් සඳහා උස අඩි 05 අගල් 02කට නොඅඩු විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත පරීක්ෂණයකින් සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

ii. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේ දී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙක් සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අමතර අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2. වෘත්තීය සුදුසුකම් | 40 |
| 3. බාලදක්ෂ, පරිසර නියමුහට ශිෂ්‍යභට කණ්ඩායම් නියෝජනය කිරීම | 15 |
| 4. ක්‍රීඩා කුසලතා | 10 |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන දක්ෂතා | 05 |

iv. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාවය අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිකව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම සිදුවේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams. gov.lk යන වෙබ් අඩවිය හරහා සිදුකරනු ඇත.

v. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් පුහුණු කාලසීමාවක් යටතේ වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට වසර 03ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03ක සතුටුදයක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

06. *විෂය නිර්දේශය :*
ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | කාලය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 1 | 40% |

අපේක්ෂකයන්ගේ සිතීම, තර්කන හැකියාව, විශ්ලේෂණ හැකියාව, හා තීරණ ගැනීමේ හැකියාව හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුත් ප්‍රශ්න පත්‍රයකි.

07. *අයදුම්පත් හා අනෙකුත් විස්තර* :

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය ඊළඟ පිටුවලට ද, ඇතුළත් වන පරිදි සෙ. මී. 21x29 (A4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම් පත්‍රය විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තරය අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා තිබේද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වන සත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2017(2018)'' යනුවෙන් සඳහන් කර 2018.03.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

ii. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

iv. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු රු. 240, 360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතුය.

v. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම ඉල්ලුම්පත් ස්වකීය ආයතනය/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vii. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

08. විභාග ගාස්තු :

i. විභාග ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003.02.13 යටතේ රාජ්‍ය ආදයමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කරුණාවෙන් දන්වමි. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන 2018.03.15 දිනට පෙර ගෙවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ලඟ තබා ගැනීම සුදුසුය.)

ii. කුමන කරුණක් යටතේ වුව ද, විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තු සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන බවද කාරුණික දන්වමි.

09. පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය :

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතිකය
iii. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක්, (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව)
iv. චරිත සහතික දෙකක්
v. වෙනත් අදාළ සහතික

***සැළකිය යුතුය.***-ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම්පත්‍රය සමග එවීම නොකළ යුතුයි.

10.

i. විභාගය මෙහි උපලේඛනය - 1 හි දැක්වෙන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවැනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැතිනම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

ii. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.03.15 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමාසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

iv. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. අපේක්ෂකයාගේ අනන්‍යතාව.- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* .- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකිය.

13. අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවී අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජී. සූරියබණ්ඩාර,
වනජීවී අධ්‍යක්ෂ ජනරාල්.

වනජවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන බණ්ඩ 2 නිලධර ගණයට අයත් වනසත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2017 (2018)

### Open Competitive Examination for Recruitment to the Post of Management Assistant - Tech/Non-Tech Seg 2 wildlife Guard of the Wildlife Department - 2017(2018)

විභාගයට පෙනී සිටින නගරය :

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න.)

01 විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

02. (i) මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(උද. GUNAWARDHANA M. G. B. S. K.)
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

03. (i) ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. (i) උපන් දිනය :
අවුරුද්ද : මාසයඃ දිනය
(ii) 2018.03.15 දිනට වයස :
අවුරුදු මාස දින

07. *පුරවැසිභාවය :*
පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

08. ජංගම දුරකථන අංකය :

09. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

10. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :—————.

11. වෘත්තීය සුදුසුකම් :—————.

12. (i) විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :—————.
(ii) ලදුපත් අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.

13. (i) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත
(ii) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
(i) ආයතනය :—————.
(ii) මුල් පත්වීමේ දිනය :—————.
(iii) තනතුර :—————.
(iv) වැටුප :—————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :
(i) :—————.
(ii) :—————.

16. අයදුම්කරුවන්ගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන,
(අත්සන සහතික කරන්නා ඉදිරියේදී අත්සන යෙදිය යුතුය)

දිනය :—————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ————————— මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2018 ————————— වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බවද, සහතික කරමි.

—————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————;
ලිපිනය :—————;
දිනය :—————.

(නිල මුද්‍රාව තබන්න)

18. අයදුම්කරු රජයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත්කරන.................................මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ ස්ථිර/ තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම :—————,
තනතුර :—————,
(මුද්‍රාව තබන්න)
දිනය :—————.
(අනවශ්‍ය වචන කපා හරින්න)

*සැ. යු.*-ඉල්ලුම් පත්‍රය සමග මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

උපලේඛනය - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

02-525/2

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග රාජකාරි සඳහා සම්පත් පුද්ගල සංචිතය පිහිටුවීම**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග රාජකාරි සඳහා සහාය ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය දරන සම්පත් පුද්ගල සංචිතය පිහිටවනු ලබන අතර පාසල් විභාග හැර අනෙකුත් විභාග සඳහා වූ රාජකාරි මෙයට ඇතුළත් වේ. මෙම සංචිතයට පහත සඳහන් රාජකාරි කටයුතු සඳහා සම්පත් පුද්ගලයින් බඳවා ගැනේ.

| අංකය | සම්පත් පුද්ගල රාජකාරිය |
|---|---|
| 01 | ප්‍රශ්නපත්‍ර සකස් කිරීම හා ප්‍රමිත කිරීම |
| 02 | ප්‍රශ්නපත්‍ර භාෂා පරිවර්තනය කිරීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/වෙනත්) |
| 03 | උත්තරපත්‍ර ඇගයීම/පිළිතුරු පත් ලකුණු කිරීම |
| 04 | විද්වත් සහාය අවශ්‍ය වන ඇගයීම් හා පරීක්ෂණ සේවා |

02. මේ සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශ්ව විද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, කාර්මික විද්‍යාල, පාසල් ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවය කරන කථිකාචාර්යවරුන්/ගුරුවරුන්ට සහ නිලධාරීන්ට ඉල්ලුම් කළ හැකිය. එමෙන්ම ඉහත ආයතනවල සේවය කළ විශ්‍රාමිකයින්ටද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

03. මෙයට යාකර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කරන ලද අයදුම් පත්‍ර ''විභාග කොමසාරිස් ජනරාල්, ඇගයීම් - ආයතනික විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, පැලවත්ත, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන රාජකාරිය සඳහා අදළ අංක/අංකය ද සහිතව ''**සම්පත් පුද්ගල රාජකාරි අංක/අංකය . . . . . සඳහා අයදුම් පත්‍රය**'' යනුවෙන් පැහැදිලි ව දක්වන්න.

04. සැලකිය යුතුයි :-

(i) ඉල්ලුම් පත්‍රය 'www.doenets.lk' යන වෙබ් අඩවියෙන් ද බාගත හැකි ය.
(ii) ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල නොකළ හා සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
(iii) විශ්‍රාමික අයදුම්කරුවන් හැර අනෙකුත් අයදුම්කරුවන් තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කර අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.
(iv) ලබාගන්නා සේවාවන් සඳහා කෙරෙන ගෙවීම් විභාග දෙපාර්තමේන්තුවේ අනුමත ගෙවීම්වලට අනුකූලව සිදු කරනු ලැබේ.
(v) සම්පත් පුද්ගල සංචිතය යාවත්කාලීන කිරීම සඳහා නිරන්තරව ලැබෙන අයදුම්පත් සලකා බලනු ලැබේ.

05. සේවයේ යෙදවීම පිළිබඳ පොදු නියමයන් :-

(i) මෙය ස්ථිර තනතුරක් නොවන අතර, සේවාවන් සඳහා තෝරාගැනීම හා සේවය අවසන් කිරීම විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි සිදු කෙරේ.
(ii) තෝරාගත් සම්පත් පුද්ගලයින් තම සේවය අවශ්‍ය වූ කල්හි සතියේ/සති අන්තයේ/රජයේ නිවාඩු දිනවල හා කාර්යාල වේලාවෙන් පසුව ලබා දීමට බැඳී සිටිය යුතුය.
(iii) යොදවන කාර්යය සම්බන්ධයෙන් රහස්‍යභාවය ඔබ විසින් රැකිය යුතු අතර, නිරවද්‍යතාව හා කාර්යක්ෂමතාව පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. 1968 අංක 25 දරන විභාග පනත හා අනෙකුත් විධිවිධාන හොඳින් කියවා ඒ අනුව කටයුතු කිරීමටත් බැඳී සිටිය යුතුය.

06. සම්පත් පුද්ගල රාජකාරි කටයුතු සඳහා අපේක්ෂිත විෂය ක්ෂේත්‍ර හා විෂයයන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ:-

| | විෂයය ක්ෂේත්‍රය | විෂයය |
|---|---|---|
| 1 | ආගම | බුද්ධ ධර්මය, ත්‍රිපිටක ධර්මය, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය |
| 2 | භාෂාව | සිංහල, දෙමළ, ඉංග්‍රීසි,සාහිත්‍ය රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/අරාබි) භාෂාව හා අවබෝධය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), පාලි, සංස්කෘත, ප්‍රාකෘත, ප්‍රංශ, ජර්මන්, හින්දි, ජපන්, අරාබි, කොරියන්, චීන, රුසියන් |

| | විෂය ක්ෂේත්‍රය | විෂය |
|---|---|---|
| 3 | ගණිතය | ගණිතය, සංයුක්ත ගණිතය (ශුද්ධ/ව්‍යවහාරික), උසස් ගණිතය, සංඛ්‍යානය, ව්‍යාපාර ගණිතය |
| 4 | විද්‍යාව | භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව (උද්භිද/සත්ත්ව), කෘෂි විද්‍යාව, පශු වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, උද්‍යාන පාලනය, සත්ත්ව පාලනය) |
| 5 | ඉංජිනේරු විද්‍යාව | සිවිල් ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව, මෝටර් කාර්මික විද්‍යාව, පුස්තකාල හා ප්‍රලේඛන විද්‍යාව |
| 6 | තාක්ෂණය/ තාක්ෂණවේදය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂි හා ආහාර තාක්ෂණය, ජලජ ජීවී සම්පත් තාක්ෂණවේදය, නිර්මාණකරණය හා (ඉදිකිරීම්/යාන්ත්‍රික/විදුලි හා ඉලෙක්ට්‍රොනික) තාක්ෂණවේදය |
| 7 | කළමනාකරණය | කළමනාකරණය හා සංවිධාන ක්‍රම, මානව සම්පත් කළමනාකරණය, සැලසුම්කරණය හා කළමනාකරණය |
| 8 | වාණිජ විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය, ව්‍යාපාර සංඛ්‍යානය, අලෙවිකරණය, ව්‍යවසායකත්ව අධ්‍යයනය |
| 9 | ගණකාධිකරණය | ගිණුම්කරණය, මූල්‍ය ගණකාධිකරණය, පිරිවැය ගණකාධිකරණය, කළමනාකරණ ගණකාධිකරණය |
| 10 | විගණනය හා මුදල් | මුදල් රෙගුලාසි හා ගිණුම්, විගණනය |
| 11 | මූල්‍ය | රජයේ මුදල් රෙගුලාසි, මූල්‍ය ක්‍රම, බැංකු ක්‍රම |
| 12 | ආර්ථික විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| 13 | පරිපාලනය | ආයතන සංග්‍රහය, කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය |
| 14 | සමාජ විද්‍යාව | දේශපාලන විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
| 15 | භූගෝල විද්‍යාව | භූගෝල විද්‍යාව, ඉතිහාසය |
| 16 | සෞන්දර්ය | චිත්‍ර, උඩරට නැටුම්, පහතරට නැටුම්, සබරගමු නැටුම්, භරත නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, කර්ණාටක සංගීතය, නාට්‍ය හා රංග කලාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) |
| 17 | නීතිය | නීතිය |
| 18 | සාමාන්‍ය දැනීම හා අවබෝධය | සාමාන්‍ය දැනීම, අවබෝධය, සාමාන්‍ය දැනීම හා ලෝක තතු (විවිධ ක්ෂේත්‍ර) |
| 19 | අභියෝග්‍යතාව | බුද්ධි පරීක්ෂණ, ආකල්ප පරීක්ෂණ, ඒ ඒ වෘත්තීන් සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ |
| 20 | ලඝුලේඛනය | ලඝුලේඛනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), විද්‍යුත් ලේඛනකරණය |
| 21 | බ්‍රේල් | බ්‍රේල් උත්තර පත්‍ර පරිවර්තනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) |
| 22 | පරිවර්තනය | අදාළ විෂය හා මාධ්‍යය |
| 23 | විවිධ ක්ෂේත්‍ර | වෙනත් විෂයයන් |

(අයදුම් පත්‍රයෙහි විෂය ක්ෂේත්‍රය හා විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කරන්න.)

උක්ත විෂය ක්ෂේත්‍රවලට අමතරව ඔබ ප්‍රවීණත්වය ලබා ඇති වෙනත් විෂයයන් හා විෂය ක්ෂේත්‍ර වේ නම් අදළ විෂය ක්ෂේත්‍රයද ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන්න.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 30 වැනි දින,
පැලවත්ත, බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

Catagory according to Paragraph No. 01

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

For Office use only

Registration No. ☐

Specimen Application

**Department of Examinations, Sri Lanka**
**Establishment of the Pool of Resource Persons for Examination Duties**

01. (i) Full Name : Rev/Prof./Dr./Mr./Mrs./Miss:………………………………………………
………………………………………………………………………………………
(ii) Name with Initials : ………………………………………………………………………

02. (i) (a) Working in an institution at present ☐ (b) Retired ☐ (Mark ✓ )
(ii) Address (If retired write the address of the place where you worked last)
(a) Official : …………………………… (b) Private : ……………………………
…………………………… ……………………………
…………………………… ……………………………
(c) E-mail : ……………………………
(iii) Telephone No.
(a) Official : ☐☐☐☐☐☐☐☐☐☐ (b) Residential : ☐☐☐☐☐☐☐☐☐☐
Fax : ☐☐☐☐☐☐☐☐☐☐ Mobile : ☐☐☐☐☐☐☐☐☐☐

03. (i) Date of Birth : Y Y Y Y | M M | D D
(ii) Age (as at 2018.01.30) : Years ☐☐☐☐ Months ☐☐ Days ☐☐

04. (i) National Identity Card No. : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. (i) Present/retired Post :……… (ii) Date of appointment to the present post: Y Y Y Y M M D D
(iii) Service & Grade :……………(iv) Date of appointment to the service: Y Y Y Y M M D D
(v) If retired, date of retirement : Y Y Y Y M M D D

06. (i) Number intended to apply according to the table in paragraph 01. 1 2 3 4
(ii) Subject fields and subjects intended to apply. (Sinhala - S, Tamil- T, English - E)

| Field No. | Subject Field | Subjects | Medium | | |
|---|---|---|---|---|---|
| | | | S | T | E |
| | | | S | T | E |
| | | | S | T | E |
| | | | S | T | E |

07. (i) Mother tongue :……………… (ii) Medium studied at school :………………
(ii) Highest Educational and Professional qualifications :

| Course/Degree | Institution | Subjects studied | Medium | Period |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

08. Professional experience :

| Post | Work Place | Period/Years |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

09. Experience in the applied field :
1. ………………………………………………………………………………………
2. ………………………………………………………………………………………
3. ………………………………………………………………………………………
4. ………………………………………………………………………………………

10. Details of two non-related referees to certify particulars given by you (Optional) :
Name : ………………………………………………………………………
Post : ………………………………………………………………………
Work Place : ………………………………………………………………………
Telephone No. (Land) : ………………………………………………………………………
(Mobile): ………………………………………………………………………

11. I do hereby declare that the information furnished above is true and accurate and that I have not been debarred from examination duties or accused of any disciplinary action at present. I am also aware that, I will not be selected if any disqualification is revealed. In case a disqualification is found after recruitment, my duties will be terminated under the Examinations Act No. 25 of 1968. I acknowledge that the decision of the Commissioner General of Examinations is final regarding this matter.

……………………… ……………………… ………………………
Date NIC No. Signature of the Applicant

Certification

12. Only for the officers who serve at present
I certify that the information provided in the application form from No. 01 to 11 with regard to the above named applicant is true according to his/her personal file and that he/she is eligible for examination duties as a resource person and he/she is in sound health.

……………………… ……………………… ………………………
Date Official Stamp Signature of the Head of Institution

13. For retired officers only
I certify and solemnly declare that the information furnished by me in the above application form is true and correct and that I have not been debarred from examination duties previously or sent on compulsory retirement and that I am in good health to perform examination duties as a resource person.

……………………… ……………………… ………………………
Date NIC No. Signature of the Applicant

02-577

---

**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

**උසස් තාක්ෂණ ආයතන සහ ආයතන අංශ සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2018 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2017 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම් කරන පිළිවෙළ:*

ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රුපියල් පන්සියයක (රු. 500) මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-2-001-1-3397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත 'ආ' කොටසේ දැක්වෙන ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්ෂණ ආයතනයට හෝ උසස් තාක්ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම්, අයදුම් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රුපියල් පන්සියයක (රු. 500) වටිනාකමකින් යුත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදළ කොටුව තුළ අළවා අයැදුම්පත් ඉදිරිපත්කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් බැංකු ගිණුමකට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. තම ප්‍රදේශයේ ආයතන සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට එනම් 2018.03.16 දිනට පසු ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*පාඨමාලා පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියලුම පාඨමාලා පැවැත්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත හෝ ස්වයං රැකියාවන්හි නියුක්ත අයට පමණි.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන (Full-time) පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධ කාලීන (Part-time) පාඨමාලා සඳහා සමාසික ගාස්තු (Semester) පහත පරිදි වේ. :

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 5,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 8,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*ලියාපදිංචි කිරීම :*

සුදුසුකම් අනුව තෝරා ගත් අයදුම්කරුවන් ලියාපදිංචි වීමේදී අදල ලේඛනවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා ගම්පහ උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා කොළඹ උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා සහ පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

**"අ" කොටස**

*එක් එක් පාඨමාලා සඳහා ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම් :*

**01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි.**

**01.1 පූර්ණ කාලීන - කාලය වසර 4 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය යටතේ ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සියලුම විෂයයන් එක්වරකදී සමත්ව තිබිය යුතුය.

අ. පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම, අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී ආර්ථික විද්‍යාව හෝ ගිණුම්කරණය විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීමට විකල්පයක් ලෙස සැලකේ ;

සහ

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

01.2 අර්ධ කාලීන - කාලය වසර 4 යි

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලුම විෂයයන් සමත් වී තිබීම.

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන -

(අ) ගණක ශිල්පිය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ආ) ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) ලබා තිබීම;

*හෝ*

(ඇ)ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එම පාඨමාලාවේ දෙවන වසරට බඳවා ගැනීම, ඇතුලත්වීමේ සුදුසුකම් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන (ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය/කළමනාකරණ) පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සමත් ව තිබීම.

(ii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ්‍යය ඩිප්ලෝමාව දෙවන වසර සමත්ව තිබීම.

(iii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමාව සමත් ව තිබීම.

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධියක් (ගණකාධිකරණ/ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/මානව සම්පත් කළමනාකරණ/ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර වාණිජවේදී) තිබීම.

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්‍ෂණය සමත්ව තිබීම.

(vi) වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA-UK ) I සහ II පරීක්‍ෂණය සමත්ව තිබීම.

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ (AAT) III අදියර පරීක්‍ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CMA-Sri Lanka) අවසාන විභාගය (ACMA) සමත්ව තිබීම.

*සැලකිය යුතුයි* :- උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව - පූර්ණ කාලීන/අර්ධ කාලීන

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

**02. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා - (උ. ජා.ගො.සේ.ඉ.ඩි) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම.

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - (උ. ජා. ව්‍යා. ප. ඩි.) පූර්ණ කාලීන — කාලය වසර 2 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් එක් වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- (උ. ජා. වා මූ. ඩි.) - පූර්ණ කාලීන - කාලය වසර 2 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් එක් වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික පාරිභෝගික විද්‍යාව හා නිපැයුම් තාක්ෂණ ඩිප්ලෝමා - (උ.ජා.පා.වි.නි.තා.ඩි) 03 යි- පූර්ණ කාලීන - කාලය වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) ගෘහ ආර්ථික විද්‍යාව විෂය සහිත ව අ. පො. ස. (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවක් යටතේ සියලුම විෂයයන් එක්වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. - සිවිල්) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. - විදුලි සහ විද්‍යුත්) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**08. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. - යාන්ත්‍රික) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (උ.ජා.ඉ.ඩි.)**

**09.1 පූර්ණ කාලීන - කාලය වසර 2 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන් එක්වරක දී සමත්ව වී තිබීම ;

*සහ*

(ii) අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි භාෂා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ;

*හෝ*

ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි) ;

*හෝ*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

**09.2 අර්ධ කාලීන - කාලය වසර 2 1/2 යි**

සුදුසුකම්වලට අතිරේකව අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්‍ෂණ ඩිප්ලෝමා - (උ.ජා.ආ.තා.ඩි.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරා යටතේ සියලුම විෂයයන් එක් වරක දී සමත් ව තිබිය යුතු ය;

*සහ*

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - (උ. ජා. තො. තා. ඩි.)**

**11.1 පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් එක් වරක දී සමත්වී තිබීම (ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, වාණිජ්‍යය, තාක්ෂණික සහ කලා (ICT විෂය සඳහා ප්‍රමුඛතාව දෙනු ලබයි.

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11.2 අර්ධ කාලීන - කාලය වසර 2 1/2 යි**

11.1 සුදුසුකම්වලට අතිරේක ව අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - (උ. ජා. ක. ඩී.) පූර්ණ කාලීන - (කාලය වසර 3 කි).**

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක් වරක දී සමත්ව තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**13. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමා - (උ. ජා. ව්‍යා. ක. ඩී.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක් වරක දී සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**14. උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා - (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය - (උ. ජා. තා. ඩි. කෘෂි) පූර්ණ කාලීන - කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ./පෙළ.) ජීව විද්‍යා විෂයය ධාරාව යටතේ (ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය) යන විෂයයන්ගෙන් විෂයයන් තුනක් සහිතව සියලුම විෂයයන් එක්වරකදී සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**16. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - (උ.ජා.ස.ස.ක.ඩි.) පූර්ණ කාලීන කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක්වරකදී සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා. පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සැලකිය යුතුයි.-

- අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රය හා සම්බන්ධ රැකියාවක් හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් තිබිය යුතුය.
- පූර්ණ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) කර්මාන්ත පුහුණුවක් ඇතුලත් වේ.
- අර්ධ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) ව්‍යාපෘතියක් ඇතුලත් වේ.

"ආ" කොටස

**උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :**

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්‍ෂණ ආයතනය, අම්පාර | මහාචාර්ය ඉවන් ඒ. හාඩි මාවත, අම්පාර | 063-2222056 063-2223035 0718100975 0717638653 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි, උ. ජා, ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 02 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, අනුරාධපුරය | අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය | 025-2234417 0716564572 0715177580 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ස. ස. ක. ඩි. |
| 03 | උසස් තාක්‍ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218 055-2223818 0778094573 0712347677 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පු. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.), (උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 04 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, මඩකලපුව | කෙලින් වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති, මඩකලපුව | 065-2247519 065-2247470 0778641182 0716376307 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15. | 011-2521152 011-2521282 0777800909 0714970484 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ප්‍ර. මි. ස. ඩි, උ. ජා. ගො. සේ. ඉ. ඩි. |
| 06 | උසස් තාක්‍ෂණ ආයතනය, දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 0718085371 0714407665 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |
| 07 | උසස් තාක්‍ෂණ ආයතනය, ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2246179 0771681233 0710968530 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ස. ස. ක. ඩි |
| 08 | උසස් තාක්‍ෂණ ආයතනය, ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519 033-2292544 0715511205 0772917792 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ආ. තා. ඩි., උ. ජා. පා. වි. නි. තා. ඩි. |
| 09 | උසස් තාක්‍ෂණ ආයතනය, යාපනය | අංක 665/2 වෙරළ පාර, ගුරුනගර්, යාපනය | 021-2222595 021-2229803 0718447486 0777113664 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.) උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.), උජා. ඉංග්‍රීසි ඩි. (අ.කා) උ. ජා ස.ස.ක.ඩි. (පූ.කා.), උ. ජා. ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 10 | උසස් තාක්‍ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2232097 0719175285 0774538133 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ.ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක.ඩි. |
| 11 | කෑගල්ල උසස් තාක්‍ෂණ, ආයතනය කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297 035-2221713 0714848210 0716254659 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 12 | උසස් තාක්‍ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583 037-2224911 0714882528 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 13 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, මන්නාරම | අංක 201, පළාත් ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානය (PESC), තලෙයිමන්නාරම් පාර, මන්නාරම | 023-3122555 0767966111 | උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ස. ස. ක.ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, නාවලපිටිය | පරණ නගර සභා ගොඩනැගිල්ල, නාවලපිටිය | 054-2050634 0713702889 | උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි, උ.ජා. ක. ඩි. |
| 15 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492 045-2231493 0718147124 0713930219 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.) |
| 16 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, සමන්තුරේ | උසස් තාක්‍ෂණ ආයතන මාවත, සමන්තුරේ | 067-2261304 0775153500 | උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි .(අ. කා.) උ. ජා. තො. තා. ඩි.(පූ. කා.) |
| 17 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යාය වත්ත, නෙටොල් පිටිය, තංගල්ල. | 047-2241845 047-2241846 0714491932 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 18 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නිය පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය. | 026-2223232 026-2050617 0773659589 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 19 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | ඒ 9 පාර, වේපන්කුලම් ඕමාන්තෙයි වවුනියාව. | 024-2052733 0776162010 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |

*සැළකිය යුතුයි :*

(1) අ. පො. ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ උසස් ජාතික ඩිප්ලෝම පූර්ණ කාලීන පාඨමාලා සඳහා අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්‍ෂණය සමත් ව තිබීම අනිවාර්ය වේ.

(2) උසස් ජාතික පා. වි. නි. තා. ඩි./ඉංග්‍රීසි ඩි./ස. ස. ක. ඩි. / තො. තා. ඩි/ආ. තා. ඩි/ක. ඩි/ව්‍යා. ක.ඩි පාඨමාලාවන් හැර අනෙකුත් සියලු පාඨමාලාවන් සඳහා තෝරා ගැනීමේ නිර්ණායක වනුයේ, අ. පො. ස. (උ/පෙ.) හෝ Z-score අගයන් වේ.

(3) උසස් ජාතික පා. වි. නි. තා ඩි./ඉංග්‍රීසි ඩි/ස. ස. ක. ඩි/තො. තා. ඩි/ආ. තා. ඩි/ක. ඩි/ව.ක.ඩි පාඨමාලාවන් සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී ආයතන මට්ටමින් ලිඛිත පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ.

(4) පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(5) උසස් තාක්‍ෂණ ආයතනයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 100ක් ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

(6) උසස් තාක්ෂණ ආයතන අංශයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 50ක් ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

(7) අයදුම්පතේ සඳහන් කර ඇති පළමු කැමැත්ත සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(8) සියලුම පාඨමාලා හදරන සිසුන් සතියේ දිනවල මෙන්ම අවශ්‍යතාවක් මතු වූ විටක දී සති අන්තයේ ඇතැම් දිනවල පන්ති සඳහා සහභාගි විය යුතු ය.

(9) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ දේශන පළමු හා දෙවන වසරේ දී සතියේ දිනවල පමණක් ද, තෙවන වසරවලදී හා සිව්වන සති අන්තයේ දී පමණක් පවත්වනු ලැබේ.

(10) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණ කාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල ද, තෙවන වසර සඳහා සති අන්තයේ ද පවත්වනු ඇත.

(11) තෝරා ගැනීමෙන් පසු කුමන හේතුවක් මත හෝ පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

(12) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ පාඨමාලාවකට ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකුට අදළ ආයතනය විසින් ලියාපදිංචි වීමට දී ඇති අවසාන දින සිට දින 60ක කාලයක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය අවලංගු කර ගත හැක.

(13) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව මගින් නිර්දේශ කරනු ලබන හා පාලක සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් ඇතුළත්වීමේ සුදුසුකම් සලකා බලනු ලැබේ.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2018.03.16 වේ.

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

*Office use only* – Course Number :........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

**APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES IN YEAR — 2018**

(Pleas filled in English Block letters)

*Name of the Courses in the Order of Preference*

1. HND........................................................................
2. HND........................................................................
3. HND........................................................................

(Priority will be given to first preference)

1. Name with initials :————.
2. Name/Names denoted by Initials :————.
3. Postal Address :————.
4. Date of Birth : Year :————., Month :————., Date :————.

   Age (as at 16.03.2018) : Years :————., Months :————., Days :————.
5. National Identity Card No. :————.
6. E-mail Address :————.
7. Sex : ————.
8. Administrative District :————. Contact Phone Number :————.
9. (i) Results of G. C. E. (Advanced Level) Examination :

Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... |

Common General Paper : Pass/Fail

Aggregate/Z-score of the above examination :————.

(ii) Results of G. C. E. (Ordinary Level) Examination :

Year :————. Index No.:————. Medium :————.

| *Subjects* | *Grade* | | *Subjects* | *Grade* |
|---|---|---|---|---|
| 1. ...................................... | ...................................... | 6. | ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... | 7. | ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... | 8. | ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... | 9. | ...................................... | ...................................... |
| 5. ...................................... | ...................................... | 10. | ...................................... | ...................................... |

10. Highest Qualification in English as a subject :————.

11. Only for Part-time Courses
Details of Present Employment/Self Employment :

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.
Date of Appointment :————.
Business Registration Number (BR) :————.
Date of (BR) :————.

I , do hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full time course at any other state institution or provide false or incorrect information. I do hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be Affixed below')

Affix the Bank SLIP for the amount of Rs. 500 credited to the SLIATE account in the Peoples Bank:

Name of the Bank : People's Bank
Branch : Hyde Park Corner Branch, Colombo 02
Account No. : 025-2-001-1-3397613

02-603

---

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2017

1.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 සේවා ගණයේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුර :

| *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|
| තාක්ෂණ සහායක (වාරිමාර්ග) | 104 | III ශ්‍රේණිය |

1.2 *තනතුරේ රාජකාරි ස්වභාවය :*

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරයෙකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන පහත කාර්යයන්,

* ක්ෂේත්‍රයේ නව ඉදි කිරීම්, වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරිම් සඳහා වන වැඩ පරීක්ෂා කිරිම.
* වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමිතීන්ට අනුව එම කටයුතුවලදී පවරනු ලබන වගකීම් ඉටු කිරිම.
* අදාළ ක්ෂේත්‍රයේ වාරිමාර්ග හා උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීම යනාදී ව්‍යාපාරවල මෙහෙයුම් හා නඩත්තු වැඩ පරීක්ෂා කිරීම.
* වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාරිමාර්ග, උස්සාන වාරිමාර්ග, ගංවතුර වැළැක්වීමේ හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාර, ගොඩනැගිලි, පාරවල් සහ ඒවාට අයත් රක්ෂිත පිළිබඳව අවධානයෙන් සිටීම සහ ආරක්ෂා කිරිම.

**2.0** *බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, ලකුණු ලබා දෙනු නොලැබේ.

3.0 *වැටුප් පරිමාණය* .- මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන 1 අනුව රු. 29, 840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - 48,890 (MT1-2016) වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 23,674 ක මූලික වැටුපක් හා රු. 3,665 ක ගැලපුම් දීමනාවකි.

**4.0** *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

4.1 මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක පරිවාස කාලයකට යටත් විය යුතු වේ.
4.2 මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
4.3 තාක්ෂණ සහායක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීනාතාවය ලබා ගත යුතුය.
4.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, අනුමත බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝධනවලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

5.0 *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6.0 *අවශ්‍ය සුදුසුකම් :*
6.1 අධ්‍යාපන සුදුසුකම් - භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

6.2 *වෘත්තීය සුදුසුකම් :*
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධ කාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (සිවිල්) පාඨමාලාව සමත් වී අදාළ සහතිකය (NCT-civil) ලබා ගෙන තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

6.3 *කායික සුදුසුකම්* .- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරිමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.4 *වෙනත් සුදුසුකම් :*
i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. යම් ආගමක නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
iv. තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.0 ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

8.0 *විභාග පරිපාටිය :*
විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| විෂයයන් | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

8.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය

1. *බුද්ධි පරීක්ෂණය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්‍ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයක්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහාවූ ප්‍රශ්නවලින් යුක්තය. |

2. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික සිවිල් ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

8.2 මෙම විභාගය 2018 අප්‍රේල් මස කොළඹ නගරය තුළදී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

9.0 *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ. මි. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1.0 සිට 6.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 7.0 සිට 11.00 දක්වා 02 පිටුවේ ද, අංක 12.00 සිට 14.0 දක්වා 03 පිටුවේ ද, අංක 15, 04 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මඟින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

9.3 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

9.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

9.6 තරග විභාගයට පෙනි සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

9.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීම**'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.
9.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුද වේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10.0 **අයදුම්පත්‍ර යොමු කිරීම :**
සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 මාර්තු 16 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

11.0 **විභාගයට පෙනී සිටීම :**

විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

12.0 **අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත :
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13.0 මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ඉංජි. එස්. මෝහනරාජා,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2018 පෙබරවාරි මස වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා තාක්ෂණ සහායක (වාරිමාර්ග) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - 2017**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල -1
දෙමළ -2
(අදාළ කොටුව තුළ ලියන්න)

2.0 අයදුම් කරනු ලබන තනතුරු නාමය :————.

3.0 මුලකුරු සමග නම (මුලකුරු අගට යොදු ) : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :————.

ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.
(උදා: PERERA A.B. C.)

3.1 සම්පූර්ණ නම :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ( අදාළ කොටුව තුළ ලියන්න)
පුරුෂ - M
ස්ත්‍රී - F

6.0 ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

6.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

7.0 දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

8.0 පදිංචිය :
8.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
8.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

9.0 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 විවාහක - 2

10.0 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

10.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.03.16 දිනට) වයස :
අවුරුදු : මාස : දින :

11.0 අධ්‍යාපන සුදුසුකම් :

11.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

පළමුවන වර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07 | |
| 03. | | 08. | |
| 04. | | 09 | |
| 05. | | 10. | |

11.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

දෙවන වර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07 | |
| 03. | | 08. | |
| 04. | | 09 | |
| 05. | | 10. | |

12.0 වෘත්තීය සුදුසුකම් :

| හදාරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදාරන ලද කාල සීමාව | සහතික පත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

(අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න)

13.0 අයදුම්කරුගේ සහතිකය

............................වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි. මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම්වල රාජකාරි කිරීමට එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .............................. වැනි දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න).

15.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

.................................. මයා/මිය/මෙනවිය .................................. සේවයේ නියුතු ................. ................ තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ..................................සේවයෙන් ඔහු/ඇය මුදා හැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :————.

02-681

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්

සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(1)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 මැයි මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම විභාගයට අදාල විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන අංක 1925/37, 2015 ජූලි මස 28 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

(අ) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් පහත දැක්වේ :

(i) විෂය අංකය 01 - සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු
ලකුණු 100 - කාලය පැය 1 1/2
(ii) විෂය අංක 02 - මුදල් රෙගුලාසි
ලකුණු 100 - කාලය පැය 1 1/2
(iii) විෂය අංකය 03 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය
ලකුණු 100 - කාලය පැය 02
(iv) විෂය අංකය 04 - ඉංග්‍රීසි භෂාව
ලකුණු 100 - කාලය පැය, 02

විෂයය නිර්දේශය

(i) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු :
රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx සහ xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති i, iii, iv, v, vi, viii, x හා xii යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(ii) මුදල් රෙගුලාසි :
රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(iii) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය :
අපේක්ෂකයින්ගේ පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ

(i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මග)
(ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව
(iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව
(iv) 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය,
(v) 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික ද්විතීයික හා අ.පො.ස. (උ. පෙළ)
(vi) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(vii) 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(viii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත
(xi) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xii) අධ්‍යාපනයට අදාල පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති.

(iv) English Language

This is to assess the English language competence of the following subject areas :

- English Grammar - Tense and Number, Sentences (Simple/Compound/Complex/Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, Prepositions

- Listening and Speaking Skills - General Greeting and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills interviewing Skills, Meetings.

- Writing Skills - Internal modes of communication, Ecrmal Correspondence Skills, writing Descriptions/ Explanations, Summery writing skills report writing skills.

සැ.යු:- අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40% ක ප්‍රමාණයක් ලබා ගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් විෂයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත්විය හැකිය.

උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**03. විභාගයේ භාෂා මාධ්‍යය**

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) තරඟ විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරඟ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද, තරඟ විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙලිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ''ඉල්ලුම්පත්‍රය මෙහි දක්වෙන ආකෘති පත්‍රයට අනුව ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකසා ඉදිරිපත් කළ යුතුය. ''ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ

ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත අමුණා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. **ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.**

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

සටහන : ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකෙයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07. ඉල්ලුම්පත්‍ර 2018 වර්ෂයේ මාර්තු මස 16 වන දින හෝ ඊට පෙර ''**විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම්පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ'' **ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)**'' යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලැබුණිනම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත ද, අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මගින් යොමු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. අයදුම්පත්‍රයේ ද, විභාග සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. ''විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.''

11. විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සුදුසු හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් කුමක් වුවත් වලංගු වේ :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය :

(i) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(ii) විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා ගාස්තුව | රු. 500 කි |
| එක් විෂයයකට | රු. 250 කි |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල් ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි.

14. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ඇත.

15. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16. **සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.**

17. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 05 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**ඉල්ලුම්පත්‍රය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(11)
Efficiency Bar Examination for the Officers in Grade III of Sri Lanka Teacher Educators' Service - 2017 (11)

ඉල්ලුම්පත්‍ර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ'' යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. (විභාගයේ නම, කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දක්විය යුතුය).

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :-
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උද : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය: (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශපත්‍ර මෙමලිපිනයට එවනු ලැබේ.) :————.
(ii) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iii) ජංගම දුරකතන අංකය :————.

03. (i) ජාතික හැඳුනුම්පත් අංකය :
(ii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

04. නිවේදනයේ දෙවන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| විෂයය අංකය | විෂයයේ නම |
|---|---|
| | |
| | |
| | |
| | |

05. (i) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
(ii) පදවි නාමය :————.

06. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේද එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න :

| විෂයය | වර්ෂය | මාධ්‍යය | විභාග අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |

07. විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදාළ තොරතුරු :

(i) ලදුපත් අංකය :————.
(ii) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
(iii) දිනය :————.
(v) ගෙවූ මුදල :————.

ලදුපත එහි එක් දාරයක් මගින් මෙහි අලවන්න.

08. ඉහත දක්වෙන විස්තර නිවැරදි බවත් ගැසට් නිවේදනයේ 03 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි. අපේකෂකයා/අපේක්ෂිකාව විභාග ගාස්තුවෙන් නිදහස් බවද/නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/මධ්‍යස්ථානාධිපතිගේ අත්සන
හා පදවි නාමය,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදළ නොවන වචන කපාහරින්න.)

02-654

---

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ**

**උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී / නිලධාරිණී තනතුරු**

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්‍ෂක කෙඩෙට් නිලධාරී / නිලධාරිණී තනතුරු සඳහා 2018.01.14 දින සිට 2018.03.02 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරී තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන කෙඩෙට් නිලධාරී/ නිලධාරිණියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය රත්මලානහිදී පහත පාඨමාලාවන් පැවැත්වේ.
i. වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය අවුරුදු පහ (අවුː 5) ක්ද
ii. විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද
iii. නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය අවුරුදු හතර (අවුː 4 1/2) ක් ද
iv. විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද
v. විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද
vi. විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද
vii. විද්‍යාවේදී (බී.එස්.සී.) හටකාර්ය කළමනාකරණ උපාධිය අවුරුදු තුන මාස හයයි (අවුː 3 1/2) ක්ද
viii. විද්‍යාවේදී (බී.එස්.සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය අවුරුදු තුන මාස හයයි (අවුː 3 1/2) ක්ද
ix. විද්‍යාවේදී (බී.එස්.සී.) සමාජ විද්‍යා උපාධිය අවුරුදු තුන මාස හයයි (අවුː 3 1/2) ක්ද වේ.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය සූරියවැව දක්ෂිණ මණ්ඩපය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

x. වාස්තුවිද්‍යාවේදී උපාධිය අවුරුදු පහයි මාස හය (අවුː 5 1/2) ක්ද,
xi. විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
xii. විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
xiii. විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
xiv. විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,

3. 1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන් හා නිලධාරිණියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්‍ෂණ වලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොට ගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරීන්/නිලධාරිණියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහා පත්කරනු ලැබේ.

3. 2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට
- වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්.) උපාධිය හෝ -
- විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධිය හෝ
- වාස්තුවිද්‍යාවේදී උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්‍ෂණ (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය හෝ පිරිනමනු ලැබේ.

3. 3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3. 4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම් වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතු ය.

(i). **වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු පහකි. (කෙඩෙට් නිලධාරී)**
2017 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, **ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව** යන විෂයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ii). **විද්‍යාවේදී (බී.එස්.සී) ගගන/ ගුවන්යානා නඩත්තු / ජීව වෛද්‍ය/ සිවිල්/ විදුලි හා විද්‍යුත් / විද්‍යුත් හා විදුලි සංදේශ / නාවික/ යාන්ත්‍රික/මෙකාට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලා : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් **ගණිත විෂය** ධාරාව **(රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය)** හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(iii). නීතිවේදී (එල්.එල්.බී.) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරිනී)

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට (03)** අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| භෞතික විද්‍යාව | ගණිතය/ සංයුක්ත ගණිතය | |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

*හෝ*

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ඉහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයකට (01) හෝ දෙකකට (02)** අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය දෙකක් (02) සහ අනෙකුත් විෂය හෝ විෂයයන් පහත ලැයිස්තුවෙන් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය | දෙමළ | චීන |
| ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | සංස්කෘත | අරාබි |
| හින්දු ධර්මය / හින්දු ශිෂ්ටාචාරය | ප්‍රංශ | පාලි |
| ග්‍රීක / ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සිංහල | ඉංග්‍රීසි (විෂයය අංක 73) |
| ඉස්ලාම් / ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් | |
| ජර්මන් | කෘෂි තාක්ෂණය | නාට්‍ය හා රංග කලාව |

(iii). විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ගණිත විෂය** ධාරාව යටතේ **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව** සහ පහත සඳහන් ඕනෑම විෂයක්
**රසායන විද්‍යාව**
**උසස් ගණිතය**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(iv). **විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ගණිත විෂය** ධාරාව යටතේ **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව** සහ පහත සඳහන් ඕනෑම විෂයක්
**රසායන විද්‍යාව**
**උසස් ගණිතය**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(iv). **විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ගණිත විෂය** ධාරාව යටතේ **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව** සහ පහත සඳහන් ඕනෑම විෂයක්
**රසායන විද්‍යාව**
**උසස් ගණිතය**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**
හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම හා සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(iv). **විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා **ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව යන විෂයයන්** හදාරා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(v). **විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී/නිලධාරිනී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව** හදාරා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vi). **විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී/නිලධාරිනී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී **ඕනෑම විෂය ධාරාවකින්** අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vii). **වාස්තුවිද්‍යාවේදී උපාධිය : කාලසීමාව අවුරුදු පහයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

i. අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් :

ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

*සහ*

ii. පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් :

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |

*සහ*

iii. අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

*සහ*

iv. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් පවත්වන අවකාශීය ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතුය.

(vii). **විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරි)**

**2017 හෝ 2016** වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

**පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයකටද:**

සංයුක්ත ගණිතය /උසස් ගණිතය

*සහ*

**පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය / විෂයන්ටද පෙනී සිටිය යුතුය.**

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යයනය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

*(අ)* ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක්
*(ආ)* විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක්

(viii). විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි.(කෙඩෙට් නිලධාරි)

2017 හෝ 2016 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් ගණිත විෂය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(ix). **විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි.(කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් **ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව අතුරින් එක් විෂය ධාරාවක්** හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(ix). **විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (කෙඩෙට් නිලධාරී)**

**2017 හෝ 2016** වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් **ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව** යන විෂය ධාරාවන් අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

3. 5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාල වන පරිදි ඉංග්‍රිසි, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයන්ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3. 6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳවද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතුය.

04. <u>කෙඩෙට් නිලධාරී /නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්</u>

<u>අයදුම්කරු</u>

*අ.* ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

*ආ.* <u>2018.03.02</u> වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතුයි.

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :-

*ඇ.* අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අදාළ විෂය ධාරාවෙන්, විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය 3 ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබීම.

සහ

(i) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත්වීම
(ii) සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

*ඈ.* පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරා ලිය යුතුය.

<table>
<tr><th rowspan="2"></th><th colspan="2">යුද</th><th colspan="2">නාවික</th><th colspan="4">ගුවන්</th></tr>
<tr><th>පුරුෂ</th><th>ස්ත්‍රී</th><th>පුරුෂ</th><th>ස්ත්‍රී</th><th colspan="2">පුරුෂ</th><th colspan="2">ස්ත්‍රී</th></tr>
<tr><td rowspan="2">උස</td><td rowspan="2">5' 6"</td><td rowspan="2">5' 3"</td><td rowspan="2">සෙ.මී. 168</td><td rowspan="2">සෙ.මී. 163</td><td>වෛද්‍ය උපාධිය</td><td>5' 5"</td><td>වෛද්‍ය උපාධිය</td><td>5' 3"</td></tr>
<tr><td>වෙනත් උපාධි</td><td>5' 6"</td><td>වෙනත් උපාධි</td><td>5' 4"</td></tr>
<tr><td>බර</td><td>කි.ගෑ. 50</td><td>-</td><td>කි.ග්‍රෑ. 52</td><td>කි.ග්‍රෑ. 41</td><td colspan="2">-</td><td colspan="2">-</td></tr>
<tr><td>ශරීර ස්කන්ධ දර්ශකය</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td colspan="2"><26 සහ >17</td><td colspan="2"><25 සහ >17</td></tr>
<tr><td>පපුව</td><td>32" 'ප්‍රාශ්වාස'</td><td>-</td><td>81 cm</td><td>-</td><td colspan="2">32"</td><td colspan="2">-</td></tr>
</table>

| පෙනීම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| යුද | | නාවික | | නාවික | | | | | |
| වම | දකුණ | වම | දකුණ | වෛද්‍ය උපාධිය | | | | වෙනත් උපාධි | |
| | | | | වම | දකුණ | වම | දකුණ | වම | දකුණ |
| 6/9 | 6/6 | 6/6 | 6/6 | 6/18 | 6/18 | 6/6 | 6/6 | 6/6 | 6/6 |
| උපැස්/කාච රහිත | | උපැස්/කාච රහිත | | උපැස්/කාච රහිත | | උපැස්/කාච සහිත | | උපැස්/කාච රහිත | |

සටහන :- ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන්හි ජාතික මට්ටමේ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

ඉ. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

ඊ. අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. **සේවා කොන්දේසි :-** තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන හෝ සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරණ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව විශ්වවිද්‍යාලය මගින් කලින් කලට පනවන ලද්දාවූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 12 කට නොඅඩු සේවා කාලයක් සේවය කල යුතු වේ.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාල උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 38,000/- ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද නොමිලේ සපයනු ලැබේ.

I. ආහාර හා නවාතැන්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ.

I. සුදුසුකම් දීමනා
II. ආහාර දීමනාව
III. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරීන්ට පමණක්)
IV. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ.

I. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්
II. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී
III. නිල ඇඳුම් දීමනා
IV. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය

9. ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

අ. යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා වැටුප් සංග්‍රහය

ආ. යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන වලංගු රෙගුලාසි

ඇ. ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළදී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13. **භාෂා අවශ්‍යතා** - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේදී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. **අනන්‍යතාවය ඔප්පු කිරීම :-** අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. අයදුම්පත් :- මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේදී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් දහසක (රු:1,000/=) මුදලක් ''උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය'' නමින් ලංකා බැංකුවේ ''මොරටුව - ඉඩම'' ශාඛාවේ අංක ''9405831'' ගිණුමට බැර කර, ඔබ වෙත ලැබෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 2018.03.02 වෙනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''**ලේඛකාධිකාරී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන.**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරි/ නිලධාරිනි තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන උපාධි පාඨමාලාව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරින්ගේ/ නිලධාරිනියන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

19. උප්පැන්න සහතිකය, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස (උ/පෙළ) විභාග සඳහා ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් යන ලේඛන වල පිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලවල ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ටද පෙනී සිටිය යුතු වේ.

21. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව හෝ විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය මගින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබාදීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

23. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලිද පිළිගනු නොලැබේ.

24. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යංශය.

02-855

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩුබාහිරාදිය විකිණීම්

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මොරටුව**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2018

මොරටුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.03.24 වැනි දින පෙ.ව. 9.30 ට මොරටුව පොලිස් භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් කියන්නන් සිටීනම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට ලිඛිතව ඉදිරිපත් කල යුතු වේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ සහ පොලිස් ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව එදින පෙ.ව. 9.00 සිට 9.30 දක්වා අතර කාලය තුළ භාණ්ඩ පරීක්ෂාවට ඉඩදෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිලදී ගැනීමේදී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යාවශ්‍යවේ.

06. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවලේම වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඩබ්ලිව්. වයි. එස්. ප්‍රනාන්දු,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
මොරටුව.

2018 ජනවාරි මස 17 වැනි දින,
මොරටුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2018.03.24 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත අබලි වාහන කොටස්**

| | *නඩු අංකය* | *PR අංකය* | *විස්තරය* |
|---|---|---|---|
| 01. | AR207/14 | 4312/14 | UV-3630 දරන යතුරු පැදිය (අබලි) |
| 02. | AR 208/14 | - | 21-9331 දරන ත්‍රීරෝද රථය (අබලි) |
| 03. | AR 211/14 | 134/07 | GD-8952 දරන ත්‍රීරෝද රථය (අබලි) |
| 04. | AR 191/14 | - | QP- 0605 දරන ත්‍රීරෝද රථය (අබලි) |
| 05. | AR 360/14 | - | CB-125 හොන්ඩා වර්ගයේ දිරාගිය යතුරුපැදිය (අබලි) |
| 06. | AR 357/14 | 23/09 | ලොන්සින් වර්ගයේ දිරාගිය යතුරු පැදිය - අංක රහිත (අබලි) |
| 07. | AR 358/14 | - | ලොන්සින් වර්ගයේ දිරාගිය යතුරු පැදි 02 ක් - අංක රහිතය (අබලි) |
| 08. | AR 359/14 | - | MB 5 වර්ගයේ යතුරුපැදිය අංක සඳහන් නැත (අබලි) |
| 09. | AR 71/14 | - | WPGT- 1401 ත්‍රීරෝද රථය (අබලි) |
| 10. | AR 189/14 | - | 134-7746 යතුරුපැදිය (අබලි) |
| 11. | AR 202/14 | 09/12 | 128-1462 යතුරු පැදිය (අබලි) |
| 12. | AR 186/14 | - | JI-0279 යතුරුපැදිය (අබලි) |
| 13. | AR 361/14 | - | සම්පූර්ණයෙන්ම දිරාගිය යතුරු පැදි 03 ක් අංක රහිතයි(අබලි) |
| 14. | AR 195/14 | - | 118-0651 යතුරුපැදිය (අබලි) |
| 15. | AR 203/14 | 107/09 | JN-6578 යතුරුපැදිය (අබලි) |
| 16. | AR 356/14 | 19/09 | අංක රහිත ලොන්සින් වර්ගයේ යතුරු පැදිය (අබලි) |
| 17. | AR 362/14 | - | Mate - වර්ගයේ දිරාගිය යතුරු පැදියක් (අබලි) |
| 18. | AR 185/14 | - | 146-6180 යතුරු පැදිය (අබලි) |
| 19. | AR 192/14- | 70/09 | HW-0290 ත්‍රීරෝද රථය (අබලි) |
| 20. | AR 212/14 | 65/05 | 205-9051 ත්‍රීරෝද රථය (අබලි) |
| 21. | AR 204/14 | 174/10 | 202-0746 ත්‍රීරෝද රථය (අබලි) |
| 22. | AR 199/14 | 166/11 | HY - 3531 ත්‍රීරෝද රථය (අබලි) |
| 23. | AR 197/14 | - | 126-1420 යතුරු පැදිය (අබලි) |
| 24. | AR 196/14 | - | 144-5487 යතුරුපැදිය (අබලි) |
| 25. | AR 190/14 | - | TC- 5052 දරන යතුරු පැදිය (අබලි) |
| 26. | AR 198/14 | PR 200/11 | 153-8470 දරන යතුරුපැදිය (අබලි) |
| 27. | AR 194/14 | - | 11-3661 දරන යතුරුපැදිය (අබලි) |
| 28. | AR 206/14 | PR 66/10 | 110-2459 දරන යතුරුපැදිය (අබලි) |
| 29. | AR 200/14 | PR 37/03 | 65-4372 දරන කාර් රථය (අබලි) |
| 30. | නඩු අංක රහිත | | 13 ශ්‍රී 4555 දරන කාර් රථය (අබලි යකඩ) |
| 31. | නඩු අංක රහිත | | අංක රහිත දිරාපත් බජාජ් වර්ගයේ ත්‍රීරෝද රථය (අබලි) |

02-440

## ශ්‍රී ලංකා පොලීසිය

### පාවිච්චි කරන ලද මෝටර් වාහන, යතුරු පැදි, අමතර කොටස් සහ ටයර් වෙන්දේසි කිරීම

පාවිච්චියට නුසුදුසු මෝටර් වාහන, යතුරු පැදි, වාහන හා යතුරු පැදි අබලි කොටස්, පාවිච්චි කරන ලද හා පාවිච්චි නොකරන ලද ටයර් 2018.03.08 වැනි දින පැය 1000 ට මාතර පොලිස් උප ගරාජය භූමියේදී ද, 2018.03.13 වැනි දින පැය 1000 ට වව්නියාව උප ගරාජ භූමියේදී ද, 2018.03.15 වැනි දින පැය 1000 ට අනුරාධපුර උප ගරාජ භූමියේ දී ද, 2018.03.20 වැනි දින පැය 1000 ට මහනුවර කුණ්ඩසාලේ උප ගරාජ භූමියේ දී ද 2018.03.23 වැනි දින පැය 1000 ට අම්පාර පොලිස් උප ගරාජ භූමියේ දී ද 2018.03.29 වැනි දින 2018.04.03 වැනි දින හා 2018.04.10 වැනි දින පැය 1000 ට මිරිහාන සංදේශ කොට්ඨාස ක්‍රීඩා පිටියේ දී ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

### මිරිහාන සංදේශ කොට්ඨාස භූමියේදී වෙන්දේසි කරනු ලබන වාහන පිළිබඳ විස්තරය

| අනු. අංකය | වාහන අංකය | | වර්ගය සහ මාදිලිය |
|---|---|---|---|
| 1. | HD | 9251 | ටාටා සුමෝ |
| 2. | HD | 9811 | ටාටා සුමෝ |
| 3. | HD | 5325 | ටාටා සුමෝ |
| 4. | HD | 2342 | ටාටා සුමෝ |
| 5. | HD | 8114 | ටාටා සුමෝ |
| 6. | HD | 9017 | ටාටා සුමෝ |
| 7. | HD | 4375 | ටාටා සුමෝ |
| 8. | HD | 9047 | ටාටා සුමෝ |
| 9. | HD | 5331 | ටාටා සුමෝ |
| 10. | HD | 4776 | ටාටා සුමෝ |
| 11. | 61 | 5423 | ටොයොටා ලෑන්ඩ් කෲෂර් |
| 12. | 32 | 2778 | ටොයොටා ලෑන්ඩ් කෲෂර් |
| 13. | 301 | 4971 | ලෑන්ඩ් රෝවර් |
| 14. | 59 | 1206 | ලෑන්ඩ් රෝවර් 110 |
| 15. | 58 | 9259 | ලෑන්ඩ් රෝවර් 110 |
| 16. | 61 | 7448 | මිට්ෂුබිෂි පජේරෝ |
| 17. | 61 | 7483 | මිට්ෂුබිෂි පජේරෝ |
| 18. | 61 | 7435 | මිට්ෂුබිෂි පජේරෝ |
| 19. | 61 | 7146 | මිට්ෂුබිෂි පජේරෝ |
| 20. | 61 | 7534 | මිට්ෂුබිෂි පජේරෝ |
| 21. | 15 | 2410 | නිශාන් සනි |
| 22. | 15 | 1917 | නිශාන් සනි |
| 23. | 15 | 2457 | නිශාන් සනි |
| 24. | 15 | 1882 | නිශාන් සනි |
| 25. | 15 | 1871 | නිශාන් සනි |
| 26. | 15 | 1846 | නිශාන් සනි |
| 27. | 15 | 2449 | නිශාන් සනි |
| 28. | 15 | 1885 | නිශාන් සනි |
| 29. | 15 | 1927 | නිශාන් සනි |
| 30. | 15 | 1891 | නිශාන් සනි |
| 31. | 15 | 2364 | නිශාන් සනි |
| 32. | 15 | 2370 | නිශාන් සනි |
| 33. | 15 | 1930 | නිශාන් සනි |
| 34. | 15 | 1816 | නිශාන් සනි |
| 35. | 16 | 7560 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 36. | 16 | 7452 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 37. | 16 | 7573 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 38. | 16 | 7543 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 39. | 16 | 7587 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 40. | 16 | 7461 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 41. | 16 | 7468 | මිට්ෂුබිෂි ලාන්සර් |
| 42. | 16 | 7434 | ටොයොටා කොරොල්ලා |
| 43. | 16 | 7420 | ටොයොටා කොරොල්ලා |
| 44. | 16 | 7431 | ටොයොටා කොරොල්ලා |
| 45. | 16 | 7385 | ටොයොටා කොරොල්ලා |
| 46. | 16 | 7439 | ටොයොටා කොරොල්ලා |
| 47. | 18 | 1194 | සුබාරු |
| 48. | 300 | 6379 | හොන්ඩා සිටි |
| 49. | 300 | 6380 | හොන්ඩා සිටි |
| 50. | 300 | 0012 | හොන්ඩා එකෝඩ් |
| 51. | 300 | 1055 | හොන්ඩා එකෝඩ් |
| 52. | 300 | 0017 | හොන්ඩා එකෝඩ් |
| 53. | 300 | 0027 | හොන්ඩා එකෝඩ් |
| 54. | 18 | 4104 | මැස්ඩා 323 |
| 55. | 18 | 4096 | මැස්ඩා 323 |
| 56. | 301 | 1368 | පර්ජෝ 406 |
| 57. | GI | 8555 | නිශාන් සනි |
| 58. | LB | 2285 | ටාටා 207 සිංගල් කැබ් |
| 59. | LD | 6902 | ටාටා 207 සිංගල් කැබ් |
| 60. | 62 | 6812 | ටාටා බස් |
| 61. | 62 | 3984 | ඩිමෝ බස් |
| 62. | 60 | 5894 | ටාටා බස් |
| 63. | 62 | 4469 | ටාටා බස් |
| 64. | 63 | 2885 | අශෝක් ලේලන්ඩ් බස් |
| 65. | 60 | 5688 | ටාටා බස් |
| 66. | 62 | 1082 | ටාටා බස් |
| 67. | 62 | 1081 | ටාටා බස් |
| 68. | 63 | 2886 | අශෝක් ලේලන්ඩ් බස් |
| 69. | 62 | 4546 | අශෝක් ලේලන්ඩ් බස් |
| 70. | 60 | 5673 | ටාටා බස් |
| 71. | 62 | 6820 | අශෝක් ලේලන්ට් බස් |
| 72. | 62 | 0571 | අශෝක් ලේලන්ට් බස් |
| 73. | 47 | 0157 | ටාටා 1210 |
| 74. | 41 | 6383 | ටාටා 1313 |
| 75. | 41 | 8013 | ටාටා 1313 |
| 76. | 68 | 4316 | ෆෝඩ් ට්‍රක් |
| 77. | 68 | 6663 | ෆෝඩ් ට්‍රක් |
| 78. | 68 | 6662 | ෆෝඩ් ට්‍රක් |
| 79. | 42 | 9599 | ටාටා 1313 |
| 80. | 40 | 7202 | ටාටා 1210 |
| 81. | 40 | 6983 | ඉසුසු බවුසර් |
| 82. | 48 | 9508 | අශෝක් ලේලන්ඩ් බවුසර් |
| 83. | 68 | 6632 | ෆෝඩ් ගිලන් රථ |
| 84. | 78 | 4991 | ලෝරල් අත් ට්‍රැක්ටර් |
| 85. | 49 | 1305 | මැසිපර්ගියුෂන් 240 ට්‍රැක්ටර් |
| 86. | 97 | 6251 | සුසුකි 250 |
| 87. | 95 | 3051 | සුසුකි 400 |
| 88. | 97 | 6153 | සුසුකි 250 |
| 89. | 97 | 9619 | සුසුකි 400 |
| 90. | 97 | 9527 | සුසුකි 400 |
| 91. | 95 | 3147 | සුසුකි 400 |
| 92. | 97 | 9502 | සුසුකි 400 |
| 93. | 97 | 9567 | සුසුකි 400 |
| 94. | 97 | 9568 | සුසුකි 400 |
| 95. | 100 | 0021 | සුසුකි 450 |
| 96. | 102 | 3576 | සුසුකි 450 |
| 97. | 102 | 3562 | සුසුකි 450 |
| 98. | 102 | 3546 | සුසුකි 450 |
| 99. | 102 | 3677 | සුසුකි 450 |
| 100. | 102 | 3553 | සුසුකි 450 |
| 101. | 102 | 3585 | සුසුකි 450 |
| 102. | 102 | 3598 | සුසුකි 450 |
| 103. | 102 | 3617 | සුසුකි 450 |
| 104. | 102 | 3600 | සුසුකි 450 |
| 105. | 102 | 3660 | සුසුකි 450 |
| 106. | 102 | 3615 | සුසුකි 450 |
| 107. | 102 | 3541 | සුසුකි 450 |
| 108. | 112 | 0659 | හොණ්ඩා CD 200 |
| 109. | 119 | 1200 | හොණ්ඩා CD 200 |
| 110. | 119 | 1500 | හොණ්ඩා CD 200 |
| 111. | 119 | 1510 | හොණ්ඩා CD 200 |
| 112. | 124 | 7744 | සුසුකි GN 250 |
| 113. | 124 | 2802 | සුසුකි GN 250 |
| 114. | 140 | 9838 | සුසුකි GN 250 |
| 115. | 147 | 3543 | සුසුකි GN 250 |
| 116. | 147 | 3047 | සුසුකි GN 250 |
| 117. | 147 | 3035 | සුසුකි GN 250 |
| 118. | 147 | 3024 | සුසුකි GN 250 |
| 119. | 154 | 3007 | සුසුකි GN 250 |
| 120. | 154 | 3006 | සුසුකි GN 250 |
| 121. | 140 | 9738 | සුසුකි GN 250 |
| 122. | 154 | 8337 | සුසුකි GN 250 |
| 123. | 154 | 7718 | සුසුකි GN 250 |
| 124. | 147 | 4218 | සුසුකි GN 250 |
| 125. | 136 | 6560 | යමහා SR 250 |
| 126. | 136 | 6554 | යමහා SR 250 |
| 127. | 136 | 6511 | යමහා SR 250 |
| 128. | 136 | 6510 | යමහා SR 250 |
| 129. | 136 | 6591 | යමහා SR 250 |
| 130. | 136 | 6553 | යමහා SR 250 |
| 131. | 136 | 6506 | යමහා SR 250 |
| 132. | 136 | 6516 | යමහා SR 250 |
| 133. | 136 | 6520 | යමහා SR 250 |
| 134. | 136 | 6588 | යමහා SR 250 |
| 135. | 136 | 6525 | යමහා SR 250 |
| 136. | 136 | 6537 | යමහා SR 250 |
| 137. | 136 | 6512 | යමහා SR 250 |
| 138. | 136 | 6615 | යමහා SR 250 |
| 139. | 136 | 6590 | යමහා SR 250 |
| 140. | 136 | 6570 | යමහා SR 250 |
| 141. | 146 | 7924 | යමහා SR 250 |
| 142. | 158 | 3386 | යමහා SR 250 |
| 143. | 158 | 3242 | යමහා SR 250 |
| 144. | 158 | 3248 | යමහා SR 250 |
| 145. | 158 | 3392 | යමහා SR 250 |
| 146. | 146 | 7937 | යමහා SR 250 |
| 147. | 146 | 7931 | යමහා SR 250 |
| 148. | 159 | 7352 | හීරෝ හොණ්ඩා 100 |
| 149. | 159 | 0684 | හීරෝ හොණ්ඩා 100 |
| 150. | 159 | 7354 | හීරෝ හොණ්ඩා 100 |
| 151. | 158 | 9701 | හීරෝ හොණ්ඩා 100 |
| 152. | 159 | 3543 | හීරෝ හොණ්ඩා 100 |
| 153. | 159 | 9708 | හීරෝ හොණ්ඩා 100 |
| 154. | 158 | 9710 | හීරෝ හොණ්ඩා 100 |
| 155. | 158 | 9728 | හීරෝ හොණ්ඩා 100 |
| 156. | 158 | 9711 | හීරෝ හොණ්ඩා 100 |
| 157. | 159 | 3544 | හීරෝ හොණ්ඩා 100 |
| 158. | 141 | 1395 | හොණ්ඩා 100 |
| 159. | 153 | 9939 | යමහා 175 |
| 160. | 147 | 3051 | සුසුකි 185 |
| 161. | 153 | 4848 | සුසුකි 185 |
| 162. | MM | 0144 | සුසුකි 185 |
| 163. | MM | 0155 | සුසුකි 185 |
| 164. | MM | 0156 | සුසුකි 185 |
| 165. | MM | 0147 | සුසුකි 185 |
| 166. | 160 | 6907 | කුයින්කි 125 |
| 167. | 160 | 6911 | කුයින්කි 125 |
| 168. | GA | 8368 | යමහා 175 |
| 169. | GY | 3849 | ටී. වී. එස්. 110 |
| 170. | GY | 2843 | ටී. වී. එස්. 110 |
